**ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන**
**නියෝජිතායතනය (නාරා ආයතනය)**
**<u>තනතුරු පුරප්පාඩු</u>**

ධීවර ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය යටතේ ඇති ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය (නාරා ආයතනය) ශ්‍රී ලංකාවේ ජලජ සම්පත් පිළිබඳ විෂය සම්බන්ධයෙන් පර්යේෂණ සංවර්ධන හා කළමනාකරණ කටයුතු සිදුකරන හා සම්බන්ධීකරණය කිරීමේ වගකීම භාර ප්‍රධාන ජාතික ආයතනය වේ.

නාරා ආයතනයේ පහත සඳහන් පුරප්පාඩු වූ තනතුරු සඳහා අදාල සුදුසුකම් හා පළපුරුද්ද සහිත පුද්ගලයින්ට අවස්ථාව විවර වේ.

| අනු අංකය | තනතුර හා පුරප්පාඩු ගණන, වයස, වැටුප් ක්‍රමය | අදාල සුදුසුකම් |
|---|---|---|
| 01. | **කොක්ස්වේන්,**<br><br>පුරප්පාඩු ගණන 01<br><br>**වයස**<br><br>අවු :**18** ට නො අඩු හා අවු :**45** ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.<br><br>**වැටුප් ක්‍රමය**<br><br>සේවා ගණයට අදාළ වැටුප් කේත අංකය හා මාසික වැටුප් පරිමාණය<br>2025.01.01 දින සිට<br>MA 2-2 - රු. (50,540–10×540–7× 630 – 4×1,080 - 20×1,280– 90,270)<br>කෙසේ වුවද 2027.01.01 දින තෙක් සිදු කෙරෙන බඳවා ගැනීම් හා උසස් කිරීම් සඳහා වැටුප් ගෙවීම් කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 1/2025 හි II උපලේඛනය පරිදි සිදු කළ යුතුය. | **බාහිර අයදුම්කරුවන් සඳහා**<br><br>1907 වානිජ හා නාවුක පණතට (Mercantile shipping act. 1907) අනුව යාත්‍රා භාරකරුවෙකු (Coxswain) වශයෙන් ලබා ගත් කොක්ස්වේන් ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම හා ගිනි නිවීම ජීවිත ආරක්ෂාව ප්‍රථමාධාර සම්බන්ධව පිලිගත් පාඨමාලාවක් හදාරා තිබීම..<br><br>**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා**<br><br>ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම. |
| 02. | **එන්ජින් කාමර  කාර්මික ශිල්පි**<br><br>පුරප්පාඩු ගණන 01<br><br>**වයස**<br><br>අවු :**18** ට නො අඩු හා අවු :**45** ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.<br><br>**වැටුප් ක්‍රමය**<br><br>සේවා ගණයට අදාළ වැටුප් කේත අංකය හා මාසික වැටුප් පරිමාණය<br>2025.01.01 දින සිට<br>MA 2-2 - රු. (50,540–10×540–7× 630 – 4×1,080 - 20×1,280– 90,270)<br>කෙසේ වුවද 2027.01.01 දින තෙක් සිදු කෙරෙන බඳවා ගැනීම් හා උසස් කිරීම් සඳහා වැටුප් ගෙවීම් කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 1/2025 හි II උපලේඛනය පරිදි සිදු කළ යුතුය. | **බාහිර අයදුම්කරුවන් සඳහා**<br><br>තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන  ජාතික වෘත්තීය කුසලතා (N.V.Q.)  පහ (5) මට්ටමට නොඅඩු මට්ටමක මෝටර් බෝට්ටු  කාර්මික/ මෝටර් බෝට්ටු කාර්මික (බාහිර එන්ජින්)  ක්ෂේත්‍රයේ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.<br><br>**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා**<br><br>ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම. |

සෑම ඉල්ලුම්කරුවෙක්ම,

I. ශ්‍රී ලංකාවේ පුරුවැසියෙකු විය යුතුය.

II. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරිම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

III. විශිෂ්ඨ චරිතයෙන් යුක්ත විය යුතුය.

IV. නාරා ආයතනයෙහි කාර්ය මණ්ඩලයට බලපාන පොදු නීතිවලට යටත් විය යුතුය

ඉහත තනතුරු සඳහා තේරි පත්වන්නන් සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදල හිමිකම් කියනු ඇත. ඒ අනුව මාසික වැටුපෙන් 10% ක් සේවක අර්ථසාධක අරමුදලට දායක කළ යුතු වන අතර, නියෝජිතායතනය විසින් ස්වකීය සම්පත්වලින් වැටුපෙන් 15% ක් අරමුදලට දායක කරනු ඇත. සේවක භාරකාර අරමුලට දායක වශයෙන් වැටුපෙන් 3 % ක් වන දායක මුදලක් නියෝජිතායතනය විසින් එම අරමදලට දායක කරනු ඇත.

තනතුරට අදාල මුලික අධ්‍යාපන හා වෘත්ත්‍රිය සුදුසුකම් සනාථකර ගැනීම සඳහා එම සහතික වල පිටපත් සහ උප්පැන්න සහතිකයේ පිටපතක් ද සමඟ ඥාතීන් නොවන නිර්දේශයකයන් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන්ද, සම්බන්ධ කර ගත හැකි දුරකථන අංකයන්ද සහිතව නාරා වෙබ් අඩවියේ පළවන ආදර්ශ අයදුම්පත අනුව පිළියල කරන ලද ජීව දත්ත ඇතුළත් අයදුම්පත්‍රය **2025 දෙසැම්බර් මස 15** දින හෝ එදිනට පෙර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් යොමු කළ යුතුය. අයදුම්කරන තනතුර ලියුම් කවරයෙහි ඉහළ වම් කෙළවරෙහි පැහැදිලිව සඳහන් කළ යුතුය.

**තවද අයදුම්කරුවන් කෙටි ලැයිස්තුගත කිරිමේ අයිතිය නාරා ආයතනය සතුය.**

රාජ්‍ය ව්‍යවස්ථාපිත මණ්ඩල,සංස්ථා හෝ දෙපාර්තමේන්තුවල ස්ථිර සේවයේ නියුතු ඉල්ලුම්කරුවන් විසින් ඉල්ලුම් පත්‍ර ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය.

**අධ්‍යක්ෂ ජනරාල්**
**ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය**
**කාක දූපත,**
**මට්ටක්කුලිය,**
**කොළඹ - 15**
**011 – 2521000 / 2521006**
(www.nara.ac.lk)